පුබුදින පස් පියුම්

ප්‍රාථමික අංශය - මහනුවර අධ්‍යාපන කලාපය

අනාවරණ පරීක්ෂණය - 2025 (5 ශ්‍රේණිය)

1 පත්‍රය කාලය : පැය 01යි

නම:.....

පාසල: .....

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ නම ඉහත ඇති තිත් ඉරි මත ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂක වරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	


	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.


➢ **අංක 1 හා 2 ප්‍රශ්නවලට මුල් රූපයේ ඇති ද්‍රව්‍ය <u>වෙනුවට</u> ආදේශ කළ හැකි රූපය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01).






1





2




3

(02).






1




2




3

➢ **අංක 03, 04 ප්‍රශ්නවල වචන තුනට ම ගැළපෙන රූපයට යටින් ඉරක් අඳින්න.**


(03). ඇති කරන
සර්ව භක්ෂක
නිවස තුළ වෙසෙන



1




2




3

(04). පක්ෂී
හොට
නිශාචර



1



2



3

♦මෙම රූපය පරීක්ෂා කර බලා ඊට පහතින් දී ඇති උපදෙස් අනුව කටයුතු කරන්න.



(05). ඔබේ වම් අත පැත්තේ ඇති අත්තක මලක් අඳින්න.


(06). පොතේ මුල් පිටුව මත පොත යන්නට ඉංග්‍රීසියෙන් (BOOK) කියන වචනය ලියන්න.

(07). ගසෙහි ඇති ගෙඩියක් මත කතිර ලකුණ යොදන්න.


(08). රූපයේ පහළින් ම ඇති ශාක පත්‍රය මත හරි ලකුණක් යොදන්න.

(09). A රූපයට සමාන රූපයක් ලබා ගැනීම සඳහා B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද?

A රූපය




B රූපය



1. 6 2. 5 3. 4


➢ **අංක 10 හා 11 ප්‍රශ්නවල, කොටුව තුළ ඇති රූපවලට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.**

(10).






1



2



3

(11).





1




2




3

➢ **පලතුරුවල මිල ගණන් අනුව 12 හා 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



රු. 32.00



රු. 40.00

(12). අඹ ගෙඩියක මිල කීය ද ?


1. රු. 20.00 2. රු. 16.00 3. රු. 40.00

(13). ඇපල් ගෙඩියක 3ක මිල කීය ද ?

1. රු. 24.00 2. රු. 48.00 3. රු. 12.00


➢ **සංඛ්‍යා රටාව තේරුම් ගෙන ? ලකුණට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**


(14).




1. 6,4 2. 24,12 3. 24,6

(15).







1. 11 2. 9 3. 10

➢ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16). වයස්ගත බව වැඩිවන පිළිවෙළ අනුව දක්වා ඇති පිළිතුර වන්නේ,

1. මල්ලි -මම-අයියා-.තාත්තා
2. මල්ලි- අයියා-මම-තාත්තා
3. තාත්තා-අයියා-මම-මල්ලි

(17). කාලය අඩුවන අනුපිළිවෙළින් ඇති පිළිතුර වන්නේ,

1. දවස,වරුව,පැය,මිනිත්තුව,තත්පරය,
2. තත්පරය,මිනිත්තුව,පැය,වරුව,දවස
3. තත්පරය,වරුව,දවස,පැය,මිනිත්තුව

(18). **"දොර සෙමින් වහන්න"** යනුවෙන් රථයක දොරේ ඇති ස්ටිකරයේ සඳහන් ව තිබුණි.ඒ අනුව

1. තදින් වැසුවොත් දොර නොවැසේ
2. සෙමින් වැසීමෙන් පමණක් දොර වැසේ
3. දොර සෙමින් වැසීම අපේක්ෂා කෙරේ


(19). කවීෂ විභාගය හොඳින් සමත්වන බව පැවසුවේ ය. කවීෂ විභාගය සමත් වී ඇත.ඒ අනුව

1. කවීෂ හොඳින් පාඩම් කර ඇත.
2. කවීෂ පාඩම් කර නොමැත.
3. කවීෂ හොඳින් පාඩම් කර,පිළිතුරු ලියා ඇත.

(20). "සියලු ම තරුණයෝ පිහිනීමට දක්ෂ වෙති. තරිදු තරුණයෙකි". ඒ අනුව තරිදුට පිහිනීමට,

1. හැකි ය. 2. කිව නොහැකි ය. 3. නොහැකි ය.

(21). පහත රූපයේ දැක්වෙන්නේ සමචතුරස්‍රාකාර කඩදාසියක් හතරට නමා එහි සිදුරක් විද ඇති ආකාරයයි. එය දිග හැරිය විට දැකිය හැකි ආකාරය වන්නේ,



1. 2. 3.

(22). නිවැරදි පිළිවෙළට අංක යොදා ඇති පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(1) තේ බිවුවා (2) වතුර උණු කළා (3) තේ වක්කළා

(4) සීනි දමා කවලම් කළා

1. 2,3,4,1 2. 2,3,1,4 3. 3,2,1,4

(23). (1) පලතුරු සේදුවා (2) භාජනයකට දමා කවලම් කළා (3) ලෙලි ඉවත් කළා

(4) කුඩා කැබලිවලට කැපුවා (5) පලතුරු සලාදය කෑවා

1. 2,3,4,1,5 2. 1 ,3,4,2,5 3. 3,2,1,4,5

➢ **පහත ඡේදය කියවා ඒ අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

පැළෑටි හා ගස්වැල් සතුන් මෙන් ම අප ද මෙම පරිසරයේ ම කොටස්කරුවන් ය. වඩා බුද්ධිමත් ජීවියකු ලෙස අප ක්‍රියා කළ යුත්තේ අප හා සමානව පරිසරයට උරුමයක් ඇති සතුන් ආරක්ෂා කිරීමේ ආකල්පයකින් යුතුව ය. එමෙන් ම සතුන්ගෙන් බෝවන රෝග අවම වන පරිසරයක් නිර්මාණය කිරීමේ වගකීම ද අප වෙත පැවරේ.

(24). මෙම පරිසරයේ කොටස් කරුවන් වන්නේ කවුරුන් ද?
1. ශාක, සතුන්, මිනිසා 2. ශාක, සතුන් 3. ශාක

(25). "බුද්ධිමත් ජීවියා" ලෙස සැලකෙන්නේ කවුරුන් ද?
1. සතුන් 2. මිනිසා 3. මිනිසා සහ සතුන්

(26). ඡේදයට අනුව රෝග බෝවීමට බලපාන සාධකයක් වන්නේ,

1. මිනිසා 2. ගස්වැල් 3. සතුන්

(27). පරිසරය ආරක්ෂා කර ගැනිමේ වගකීම ඇත්තේ කාහට ද?
1. සතුන්ට 2. ගස්වැල්වලට 3. මිනිසාට

(28). මෙහි සඳහන් වන ආකල්පයක් විය යුත්තේ කුමක් ද?

1. මිනිසා ආරක්ෂා කර ගැනීම

2. පරිසරය විනාශ කිරීම

3. සතුන් ආරක්ෂා කර ගැනීම

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(29). කුරුල්ලාට -පිහාටු නම්, මාළුවාට-
1. නැට්ට 2. කරමල 3. වරල

(30). සීයාට - ආච්චි නම්, මාමාට-
1. නැන්දා 2. බාප්පා 3. තාත්තා

(31). ලොතරැයි පත් අලෙවි කරුවෙක් අංක 800 සිට 950 තෙක් ලොතරැයිපත් දිනක දී අලෙවි කළේ ය. අලෙවි කළ ලොතරැයි පත් ගණන කීය ද?
1. 149 යි 2. 150 යි 3. 151 යි

(32). 3 සිට 12 තෙක් පිළිවෙළින් ලියා ඇති සංඛ්‍යා පේළියක, 3ත් 12ත් අතර ඉතිරි නැතිව 3 බෙදෙන සංඛ්‍යා ගණන කීය ද?

1. 3 යි 2. 4 යි 3. 2 යි

➢ **දී ඇති රූපය ඇසුරින් හිස්තැන් පුරවන්න.**



(33). ළමයා බෝලය අල්ලාගෙන සිටින්නේ ..... අතින් ය.

(34). නංගී බෑගය අල්ලාගෙන සිටින්නේ ..... අතින් ය.




(35). මල්ලී අල්ලාගෙන සිටින්නේ අක්කාගේ ..... අතිනි.

(36). අක්කා මල්ලිගේ ..... අතින් අල්ලාගෙන සිටියි.

(37). නංගීගේ හා මගේ වයස්වල එකතුව අවුරුදු 32කි. නංගී මට වඩා අවුරුදු 8ක් බාල ය. ඒ අනුව මගේ වයස කීය ද?

1. අවුරුදු 24යි 2. අවුරුදු 20යි 3. අවුරුදු 12යි

(38). ආහාර, පලතුරු , හා රඹුටන් යන ඒවා අතර සම්බන්ධය පහත සටහනින් දැක්වෙයි. එහි B අක්ෂරය මගින් දක්වා ඇත්තේ මොනවා ද ?



1. ආහාර ය 2. රඹුටන් ය 3. පලතුරු ය

➢ **දී ඇති තොරතුරු කියවා 39 ප්‍රශ්නයට පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

සුපුනි පාසලේ සිට මීටර 100ක් දකුණු දිශාවට ගමන් කර කඩයට ගොස් පෑනක් මිල දී ගෙන, එතැනින් බස්නාහිර දිශාවට මීටර 300ක් ගොස් තම මිතුරාගේ නිවසට ගොස්, එතැනින් මීටර 200ක් උතුරු දිශාවට ගොස් තම නිවසට ගියා ය.

(39). පාසලේ සිට කඩයට යාමට මිනිත්තු 5ක් ගතවේ නම්, සුපුනිට මෙම ගමනට කොපමණ කාලයක් ගතවේ ද ?

1. මිනිත්තු 30කි. 2. මිනිත්තු 20කි. 3. මිනිත්තු 5කි.

(40). හිස්ව තිබූ ටැංකියකට මිනිත්තු 20ක දී ටැංකියෙන් $\frac{1}{2}$ ක් ජලය පිරුණි. සම්පූර්ණ ටැංකියේ ජල ධාරිතාව ලීටර 1000ක් නම්, මිනිත්තු 10ක දී ටැංකියට ලැබෙන ජල පරිමාව කොපමණ ද ?

1. ලීටර 125කි. 2. ලීටර 500කි. 3. ලීටර 250කි.

පුබුදින පස් හියුම්

ප්‍රාථමික අංශය - මහනුවර අධ්‍යාපන කලාපය

අනාවරණ පරීක්ෂණය - 2025 (5 ශ්‍රේණිය)

2 පත්‍රය කාලය : පැය 01යි මි.15යි

නම:.....

පාසල: .....

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ නම ඉහත ඇති තිත් ඉරි මත ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂක වරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

1. පහත දැක්වෙන ඡේදය කියවන්න.

පාසලටත් අපේ ගෙදරටත් අතර එක් තැනක පාළු අම්බලමක් වෙයි. ළමයි, තාප්පයකින් වට වී ඇති ඒ ඉඩමේ පොල් ගස් හතරේ හටගන්නා කුරුම්බා කඩා ගෙන කති. අම්බලන් වත්තේ කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා පින්නා ය. ඊළඟ නායකයා මම ය. පිනපාල ගසට නැග කුරුම්බා කඩා බිම දමන විට, ඒ කුරුම්බා අවුලා ගෙනවිත් ළමයින්ට බෙදා දෙන්නෙ මා විසිනි. පාසලෙහි සිට ගෙදර ආ විගස පොත් හා ගල්ලෑලිත් මේසයක් හෝ ඇඳක් උඩ හෝ දමා මා දුවන්නේ තවත් ළමයින් තුන් හතර දෙනෙකු සමග කෙළි සෙල්ලම් කරනු පිණිස ය.

මඩොල්දූව - මාර්ටින් වික්‍රමසිංහ

● **ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

(i) ඡේදයට අනුව පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

1) පොල් කඩාගෙන කන ළමයින්ගේ නායකයා පින්නා ය.

2) කුරුම්බා කඩා ළමයින්ට බෙදා දෙන්නෙ මා විසිනි.

3) අම්බලන් වත්තේ පොල් ගස් හතරකි.

(ii) ගසට නැග කුරුම්බා කඩා බිම දමන්නේ කවරෙක් ද? .....

(iii) පාළු අම්බලම තිබෙන්නේ කොහේ ද? .....

(iv) ඡේදයේ සඳහන් අය සෙල්ලම් කරනු පිණිස යන්නේ කුමන වේලාවේ ද?

.....

2. පහත සඳහන් වාක්‍යයේ නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

ගොවියා හේනේ .....(පැලට / පැළට) වී සිටුපද කියයි.

3. පහතදී ඇති වචනවලින් **'ඓ'** ශබ්දය මුලට යෙදී ඇති වචනය තිත් ඉරි මත ලියන්න.

සෞඛ්‍යය එකමුතු වෛද්‍ය කෘමියා .....

4. පහත සඳහන් එක් එක් වගන්තියෙහි හිස්තැනට ආ යුතු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා ..... (කළේ ය / කළහ)

(ii) නංගීගේ සරුංගලය අහසේ ඈතට ..... (පාවුණා ය / පාවුණේ ය)

(iii) ..... (ළමයා / ඔවුහු) පන්තිය පිරිසිදු කළහ.

(iv) ..... (මුවෝ / මුව දෙන) දිය බීමට වැවට යයි.

5. පහත සඳහන් වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.
දේ / හෙටට / කළ / අද / නොදමන්න / යුතු / කල්

.....

6. (i) පහත සඳහන් ප්‍රස්තාව පිරුළේ හිස්තැන සම්පූර්ණ කරන්න.

..... නඩු තීන්දු වගේ.

(ii) පහත සඳහන් අර්ථයට ගැළපෙන ඉඟි වැකිය ලියන්න.
කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම

(iii) 'සුදුසු' යන පදයේ විරුද්ධාර්ථ පදය ලියන්න. .....

(iv) 'වෘක්ෂය' යන වචනය යොදා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

.....

7. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා නැවත ලියන්න.

(i) ඇතින්නිය පෙරහැරේ ගමන් කරයි. .....

(ii) අපි සෙල්ලම් කරමු. .....

8. පහත සඳහන් නිවේදනය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

හතර වන ශ්‍රේණිය සඳහා වාර්ෂික ව පැවැත්වෙන වෛද්‍ය සායනය ජනවාරි 18 වන දින පෙරවරු 9ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. ඒදින ඔබගේ ඇස්,දත් පරීක්ෂා කර විටමින් ලබා දෙන අතර ඔබගේ එන්නත් කාඩ් පත රැගෙන ආ යුතු ය. දෙමාපියන්ගේ පැමිණීම අනිවාර්ය වේ.


(i) වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කොහේ ද? .....

(ii) ඒදින පාසලට රැගෙන ආ යුත්තේ කුමක් ද? .....

(iii) නිවේදනයේ අනිවාර්ය කර ඇත්තේ කුමක් ද? .....

9. චිත්‍ර කතාවේ හිස්තැන් සහිත කොටස් සම්පූර්ණ කරන්න.

1 සිට 08 තෙක් ලකුණු 20x1= 20




10. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න.

ලකුණු 04යි

(i) Pawpaw – ..... (ii) River – .....

11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය, ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.



.....  .....

12. පහත දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

i) two /are / there / flowers - .....

ii) cat / a / I / have - .....

13. " වංගි " යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න. .....

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මේක මගේ පුටුව. - .....

ලකුණු 08යි

15. | | |
|---|---|
| 8 | 0 |
| 9 | 6 |

මෙම ඉලක්කම් සියල්ල යොදා ගනිමින් සෑදිය හැකි විශාල ම සංඛ්‍යාව අකුරෙන් ලියන්න. .....

16. හිස්තැන් සම්පූර්ණ කරන්න.

සංඛ්‍යාව	ඉලක්කම	ස්ථානීය අගය	ඉලක්කමෙන් නිරූපිත අගය
7451	5	i).....	ii).....

17. රටාව හඳුනා ගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

55, 62, ... , ... , 83

18. පාසල් හතරක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව මෙසේ ය.

ගාමිණී විදුහල	4103
සුජාතා විදුහල	3468
ගෝතමී විදුහල	3026
විජය විදුහල	4173

වැඩි ම ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසලේ සිට අඩු ම ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසල දක්වා ඉහත පාසල් පෙළගස්වා ලියන්න.

.....


19. අධ්‍යාපන චාරිකාවක් යෑමට තව දින 245ක් ඇත. එම දින ගණන, සති කීය ද? .....

20. කසුන් 4kg 150g ක් බර වට්ටක්කා ගෙඩියක් කැබලි තුනකට කැපුවේ ය. එයින් කැබලි 2ක බර 750g ක් හා 2kg 500g ක් නම් ඉතුරු කැබැල්ලේ බර කොපමණ ද? .....

21. ළමයෙක් භාජනයකට අල්ලන ද්‍රව ප්‍රමාණය 10/ 150*ml* ක් බව නිමානය කර පැවසීය. එයට අල්ලන ලද සැබෑ ද්‍රව ප්‍රමාණය වූයේ 14/ 750*ml*ක් නම් නිමානය කළ ප්‍රමාණය හා සැබෑ ද්‍රව ප්‍රමාණය අතර වෙනස කොපමණ ද? .....

22. පලතුරු බීම වීදුරු 4ක් මිල දී ගෙන රුපියල් 500 නෝට්ටුවක් දුන් අමීන්ට ඉතුරු මුදල ලෙස රුපියල් 68.00ක් ලැබුණි නම් එක් පලතුරු බීම වීදුරුවක මිල කීය ද? .....

23. සමමිතික රූප තෝරා යටින් ඉරක් අඳින්න. .....




24. ටිකට් අලවි නියෝජිතයෙක් දින 4ක් තුළ අලවි කරන ලද ටිකට් පත් ප්‍රමාණය පහත දැක්වේ.

සඳුදා	අඟහරුවාදා	බදාදා	බ්‍රහස්පතින්දා
2100	408	1510	1048

i. අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා විකුණන ලද මුළු ටිකට් ප්‍රමාණය කොපමණ ද? .....

ii. බදාදාට වඩා සඳුදා අලවි කරන ලද ටිකට් ප්‍රමාණය කොපමණ ද? .....

25. i) පහත දැක්වෙන රූපයේ බාගයක් පාට කරන්න



ii) දොඩම් ගෙඩි 24කින් $\frac{1}{4}$ක ඇති දොඩම් ගෙඩි ගණන කීය ද? .....

26. අමල් පැය 1ක් ක්‍රීඩා කර නිවසට පැමිණි විට ඔරලෝසුවේ වේලාව සටහන් වී තිබුණේ පහත දැක්වෙන ආකාරයට ය. ඒ අනුව අමල් සෙල්ලම් කිරීම සඳහා පිටත් වූ වේලාව කීය ද?




පස්වරු.....

27.


i) පැත්තක දිග කොටු 4ක් වන සමචතුරස්‍රයක් අඳින්න.

ii) කොටු 2ක් පළල කොටු 5ක් දිග සෘජුකෝණාස්‍රයක් අඳින්න.



28. පාරේ සිට නිවසට ඇති දුර 15m කි. නිවසට ජලය ලබා ගැනීම සඳහා පාරේ සිට 5m 25cmක් හා 4m 80cm ක් දිග නළ 2ක් සම්බන්ධ කර ඇත. නිවසට ජලය ලබා ගැනීම සඳහා තව කොපමණ දිගකින් යුතු නළයක් අවශ්‍ය ද? .....

29. වෙළඳ සැලක දිනක දී විකුණන ලද පලතුරු පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.



i) කොමඩු විකුණූ ගණන මෙන් දෙගුණයක් ඇපල් විකුණුවේ නම් එය ප්‍රස්තාරයේ ලකුණු කරන්න.

ii) එදින විකුණන ලද මුළු පලතුරු ප්‍රමාණය කොපමණ ද? .....

2x15=30

30. ජාතික ගීය රචනා කරන ලද්දේ

1) ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා 2) ආනන්ද සමරකෝන් මහතා 3) එස්. මහින්ද හිමි

31. එක් වර්ගයට අයත් ශාක පත්‍ර කාණ්ඩය වන්නේ,

1) බණ්ඩක්කා, දෙල් 2) සියඹලා, අනෝදා 3) කොස්, දඹ

32. ගෘහ ආශ්‍රිත පරිසරයේ ගැවසෙන සතෙකි.

1) හූනා 2) කුකුළා 3)එළදෙන

33. රෝග බෝ කරන, ආහාර අපිරිසිදු කරන සතෙකි.

1) කැරපොත්තා 3) මදුරුවා 3) ගෙමැස්සා

34. අප වෙළඳ පොළෙන් මිල දී ගත යුතු සෞඛ්‍යයට හිතකර පාන වන්නේ,

1) කොළපාට රවුමක් සංකේතවත් කර ඇති පාන

2) රතුපාට රවුමක් සංකේතවත් කර ඇති පාන

3) කහපාට රවුමක් සංකේතවත් කර ඇති පාන

35. ජලය පිරිසිදු කර ගැනීමට අතීතයේ දී භාවිතා ඇට වර්ගයකි.

1) ඉඟිනි ඇට 2) කැකුණා ඇට 3) සියඹලා ඇට

36. කෙනෙකුගෙන් තවත් අයෙකුට රෝග බෝ වීමේ ඉඩකඩ ඇත්තේ

1) වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට යාමේන්

2) මිනිසුන් ගැවසෙන ස්ථානවල වැඩි වශයෙන් රැඳී සිටීමෙන්

3) කැස්ස හා කිවිසුම් යාමේ දී ලේන්සුවකින් නාසය හා මුඛය ආවරණය කර ගැනීමෙන්

37. දියට වැටුණු අයෙකු බේරා ගැනීම සඳහා ජලයට දැමීමට සුදුසු දෙයකි.

1) ජලය පිර වූ ප්ලාස්ටික් කෑනයක් 2) ලෑලි කැබැල්ලක් 3) විශාල ගලක්

38. මෙම මාර්ග සලකුණ දැකිය හැකි ස්ථානයක් වන්නේ,



1) රෝහලක් අසල 2) පන්සලක් අසල 3) උසාවියක් අසල

39. මාසික වාර ප්‍රවේශ පත්‍ර ලබා ගෙන ගමන් කළ **නොහැකි** වාහනයකි.

1) දුම්රිය 2) බස්රිය 3) වෑන් රථය

40. '' කැත්තක් අරගෙන වත්තට යනකොට'' මෙය

(1) තේරවිලි කවියකි (2) රබන් පදයකි (3) පැල් කවියකි

41. ජාතික කොඩියේ ජාතික අභිමානය දැක්වෙන්නේ,

1) සිංහ රූපයෙනි 2) රතු පැහැති පසුබිමෙනි 3) කහපාට තීරුවෙනි

42. කාලයකට පමණක් මල් පිපෙන ශාක කාණ්ඩය වන්නේ,

1) ඇසළ, එරබදු, කෙසෙල් 2) පොල්, වදමල්, රබර් 3) තේක්ක, මැයි, එරබදු

43. පාද ඇති, පියාපත් සහිත ශාක භක්ෂක ක්ෂීරපායී සතෙකි.

1) ගිරවා 2) වවුලා 3) මයිනා

44. ඖෂධීය බීමක් ලෙස සකස් කර ගත හැකිය.

1) පිපිඤ්ඤා 2) වැල් පෙනෙළ 3) කරවිල

45. වැලි යට දැමීමෙන් හෝ ලුණු දැමීමෙන් කල් තබා ගත හැකි ආහාරයකි.

1) කොස් ඇට 2) දෙහි 3) සියඹලා

46. අඬුව සහිත භාජනයකින් ආහාර පිළිගැන්වීමේ නිවැරදි පිළිවෙත වන්නේ,

1) බඳුනේ අඬුව ලබා ගන්නාගේ දකුණු පසින් පිහිටන ආකාරයට


2) බඳුනේ අඬුව ලබා ගන්නාගේ වම් පසින් පිහිටන ආකාරයට

3) බඳුනේ අඬුව ලබා ගන්නාට ඉදිරිපසින් පිහිටන ආකාරයට

47. රෝග වාහක පුද්ගලයන් මගින් බෝවන රෝගයක් නොවේ,

1) පැපොල 2) කොවිඩ් 19 3) කොළරාව

48. බල්බය දැල්වෙන අවස්ථාව වන්නේ,



1) B 2) C 3) A

49. ශ්‍රී ලංකාවට දිවා කාලය පවතින අවස්ථාවේ දී රාත්‍රී කාලය පවතින රටක් වන්නේ,

1) ඉන්දියාව 2) ඇමරිකාව 3) ජපානය

50. සොරබොර වැව පිහිටා ඇති පළාත වන්නේ,

1) මධ්‍යම පළාත 2) උතුරු මැද පළාත 3) ඌව පළාත

51. පහත රූපයෙන් දැක්වෙන්නේ,



1) පලාපෙති මෝස්තර 2) කැටයම් මෝස්තර 3) ලියවැල් සටහන්

52. බට්ටා පැනීම (කොටු පැනීම) සඳහා අඳිනු ලබන කොටු ගණන වන්නේ,

1) 10 2) 6 3) 8

53. සතුන් මගින් ව්‍යාප්ත වන බීජයකි.

1) හොර 2) වම් ඇපල 3) කූඩළු

54. පාසල් ගෙවත්ත සඳහා පරිසර හිතකාමී සංකල්පයකි.

1) 3D 2) 3R 3) 3A

55. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



1) ඔරලෝසුව 2) විරාම ඝටිකාව 3) මාලිමාව

56. ශ්‍රී ලංකාවට ආවේණික මාළුවෙකි.

1) මල්පුලුට්ටා 2) දියනයා 3) ගුරාමි

57. ප්‍රෝටීන් සහිත ආහාර,

1) ශක්තිජනක ආහාර වේ. 2) වර්ධක ආහාර වේ. 3) ආරක්ෂක ආහාර වේ.


58. පිලිස්සීමක දී, ඒ අවස්ථාවේ ම කළ යුතු දෙයකි.

1) දන්තාලේප ආලේප කිරීම

2. පිලිස්සුණු තැන ආවරණය කිරීම

3) පිලිස්සුණු ස්ථානයට ගලා යන සේ ජලය දැමීම

59. මෙම රූපයෙන් දැක්වෙන මැහුම් ක්‍රමය වන්නේ,



1) පිස්මේන්තු මැස්ම 2) බ්ලැන්කට් මැස්ම 3) හුරුළුකටු මැස්ම

1x30=30

60. "**සරු පොළොවක් අපට ඇතේ.**" යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න.(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

I .....

.....

ii.....

.....

iii.....

.....

2x3=06